නොයෙකුත් කාරණාවක් පෙරදැරිව අපි මව්බිමෙන් පිට මං වීමු. ඒ පිට මං වූ දා පටන් අප හට මඟහැරී යන අපගේ දේ බොහෝයි. කෙසේ වුව ද අපගේ මෙන්ම අපගේ දූ දරුවන්ගේ ද ජානවල සැඟව මෙහි ගෙන ආ දේ ද නැතුවා නොවේ. එහෙත් ඒ දේ එළි දැක්වෙන පරිසරයක් නොවේ නම්?

වාසනාවකට මෙන් බහු සංස්කෘතික පසුබිමක් අගයන රටකට අපි පා තබා සිටින්නෙමු. ඒ වාසනා මහිමයෙන් අපගේ ජාන තුළ සැඟවගත් දේ එළි දක්වන්නට අපි අද වාසනාවන්ත වී සිටින්නෙමු. මව්බිමේ සම්පත් වන අපත් අපගේ දුවා දරුවනුත් මව්බිමෙන් රැගෙන ගියා යැයි අවලාද නැගූවන් හට කදිම පිළිතුරක් දීමට පසුගිය ජනවාරියේ දී අප අතර සිටිනා නර්තන කණ්ඩායමක් සමත් වූහ. ජානවල සැඟව ගත් නර්තන හා රංගන හැකියාවන් මව්බිමේ නෙළුම් පොකුණේ වේදිකාවේ එළි දක්වන්නට මෙල්බන් නුවර විශ්ව රංගායතනයේ දරු දැරියෝ සමත්



වූහ. රසිකා කුලසිංහ නර්තනාචාර්යවරිය නිර්මාණය කර ඉදිරිපත් කළා වූ ''විජය කුවේණිය'' නර්තන රංගනය ඒ.

මව්බිමෙන් පිටමං වූ දා පටන් අපට මඟහැරී යන තවත් දෙයක් වන්නේ වර්තමාන ප්‍රවණතාවයන් ය. ඕනෑම ශිල්පයක් එක තැනක පල් වෙමින් නොරැඳී නව ප්‍රවණතාවයන්ට අනුව ඉදිරියට ගලා යයි. ඒ පිළිබඳව යාවත්කාලීන වීම වර්තමානයේ නම් එතරම් අපහසු කාර්යයක් නොවෙයි. ඒ නවීන තාක්ෂණයේ ප්‍රතිඵලයි. කෙසේ වුව ද යමෙකු ඇසුරේ යම් ශිල්පයක් හැදෑරීමට, පුහුණුවීමට, ඉදිරිපත් කිරීමට ඇත්නම්?

විශ්ව රංගායතනයෙන් පස්වන පස්වන වරටත් ඉදිරිපත් කෙරෙන ''විශ්ව නර්තන රේඛා'' නර්තන ප්‍රසංගයේ මූලික අරමුණ එහි ඉගෙනුම ලබනා දරුවන් හට නැවුම් අත්දැකීම් ලබා දෙමින් වර්තමාන ප්‍රවණතාවයන්ට මුහුවීමට වේදිකාවක් තනාදීමයි. අපි එම වේදිකාව ''නේත්‍රා'' නමින් නම් කරමු.

''නෙතු පිනවන තාරුණ්‍යයේ සුන්දරම නර්තන දැහැන'', ''නේත්‍රා'' පිළිබඳව කෙටි පිළිසඳරකට රසිකා කුලසිංහ නර්තනාචාර්යවරියව මුණ ගැසුනෙමු. අපි, ''සන්නස'' පාඨකයින් වෙනුවෙන් ඇය තවමත් සිටියේ ජනවාරියේ ''නෙළුම් පොකුණ'' වේදිකාවේ සොඳුරු මතකයේයි. හඬ අවදි කළාය. ඇය මෙලෙසින්,

''අපේ දරු දැරියෝ සීයකට වැඩි පිරිසක් එක්ක කරපු ඒ ප්‍රසංගය නම් හීනයක් වගේ විජය කුවේණි ප්‍රසංගය ඒ තරමට සාර්ථක වෙයි කියලා කවුරුවත් හිතුවේ නෑ. හුඟක් දෙනෙක් හිතුවේ පිටරට ඉන්න ළමයි කට්ටියකගෙ පොඩි වැඩක් කියලා. ළමයි වුණත් හොඳට ම කළා.''

''අපිට පුදුම විදියට ලංකාවේ මාධ්‍යවලින් ප්‍රතිචාර ලැබුණා. ඒ හින්දම ප්‍රේක්ෂකාගාරයත් හිතුවෙ නැති තරමට පිරුණා. ඒ වගේම ලංකාවෙන් ගිය දෙමාපියන්ගේ සහයෝගයත් උපරිමයෙන් ම තිබුණා. ඇත්තටම මේ ප්‍රසංගය පැවැත්වුණේ ජනාධිපති ආර්යාව, ශිරන්ති රාජපක්ෂ මහත්මියගේ ප්‍රධානත්වයෙන්. අපේ විදේශ කටයුතු භාර අමාත්‍ය මහාචාර්ය ජී.එල්.පීරිස් මහත්මයා ඇතුලු මැති ඇමතිවරුන් කීප දෙනෙක්ම සහභාගී වුණා. ඕස්ට්‍රේලියාවේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් තිසර සමරසිංහ මහත්මයාටත් අපි විශේෂ ස්තුතියක් කරන්න ඕන. අපට සෑහෙන්න උදව් කළා.''




''මෙහේ පත්තරවලිනුත් අපි යන්න කලින් ඉඳන්ම උදව් කළා. ඒක අපිට ඒ ගමනට ලොකු ධෛර්යයක් වුණා. ප්‍රසංගයෙන් පස්සේ ජනාධිපති මන්දිරයේදියි, ඕස්ට්‍රේලියානු තානාපති කාර්යාලයෙනුයි තේ පැන් සංග්‍රහ ලැබුණා. ඉතින් මේ තානාපතිවරුන් අත්සන් කරපු සහතිකයක් ඒ ප්‍රසංගයට සම්බන්ධ වුණා. හැම දරුවාටම පිරිනමන්න සූදානම් කරලය තියෙන්නේ.......''
මේ සුන්දර අතීතාවර්ජනා අතරින් නිරායාසයෙන්ම රසිකා කුලසිංහ නර්තනාචාර්යවරිය නුදුරු අනාගතයේ ඉදිරිපත් කිරීමට වර්තමානයේ



සංවිධානය වන ''නේත්‍රා'' වෙත යොමු වූවාය.

''ඉතින් මේ පාර මම අදහස් කළා අපේ මව්බිමේ හොඳින් නර්තනයේ යෙදෙන තරුණ ''තරු'' තුනක් ගෙන්නවලා ඒඅ යත් එක්ක අපේ දරුවන්ටත් නටන්න අවස්ථාව හදලා දෙන්න.'' අපගෙන් මග හැරී යන මව්බිමේ වර්තමානය දරුවන්ට ළං කරවීමටයි. ඇයගේ මෙවර උත්සාහය.

''ඉතින් ලංකාවෙන් එන්නේ ෂෙරිල් රොමේන්, හේමාල් රණසිංහ, නුවන් ගුණසේකර කියන තරුණ ශිල්පීන් තුන්දෙනයි. මේ තුන්දෙනාටම හොඳ නර්තන හැකියාවක් තියෙන බව මම දැකලා තියෙනවා. ''රියලිටි'' වැඩසටහන්වලදී.''

''ෂෙරිල් කියන්නේ ලංකාවේ ඉන්න ජනප්‍රිය නිලියන්ගෙන් කෙනෙක්. ඇය ඉස්සර වෙලාම අපිට දකින්න ලැබුණෙ ''සිරස ඩාන්සිං ස්ටාර්'' වැඩසටහනෙන්. රොෂාන් රණවනගේ සහායිකාව විදියට. ඊට පස්සේ අයි.ටී.එන්. රූපවාහිණියේ ''අමා'' ටෙලි වෘතාන්තයේ අමාගේ චරිතය රඟපාන්න ෂෙරිල්ට අවස්ථාව ලැබුණා.

''හේමාල් රණසිංහ 2005 දී ලංකාවේ ''මිස්ටර් ශ්‍රී ලංකා'' විදියට තේරිලා නිරූපණ කටයුතුවලට යොමු වුණා. ඔහු නිරූපණ තරඟවලින් ජය අරගෙනත් තියෙනවා. ඔහු ''ස්වර්ණවාහිණී'' රූපවාහිණියේ කරපු ''ඩාන්ස් ස්ටාර් ඩාන්ස්'' වැඩසටහනේ නර්තන ඉදිරිපත් කළා.''

''ඒ වගේම නුවන් ගුණසේකර කියන්නෙත් අති දක්ෂයෙක් ඔහුට හොඳ නර්තන හැකියාවක් වගේම ගායන හැකියාවකුත් තියෙනවා.''

''ඉතින් මම හිතුවා විශ්ව රංගායතනයේ සිසු සිසුවියන්ට වෙනස් විදියේ අත්දැකීමක් ලබලා දෙන්න මේ තුන්දෙනාත් එක්ක නර්තන ඉදිරිපත් කරන්න දීලා. ඒකඉතින් නරඹන අයටත් අළුත් අත්දැකීමක් වේවි. අපි සාම්ප්‍රදායික නර්තනය උගන්වන පාසැලක් විදියට සාම්ප්‍රදායික නැටුම්වලට විශේෂ තැනක් දෙන්නට ඕන. ඒ නිසා මේ ශිල්පීණ් ආවාට ඒ අයට ම සීමා නොවී අපේ සිසු සිසුවියන්ට ඒ සාම්ප්‍රදායක නැටුම් ඉදිරිපත් කරන්නත්, වෙනත් විවිධාකාර නැටුම් ඉදිරිපත් කරන්නත් ඉඩ සලස්වලයි තියෙන්නේ.''

පුහුණුවීම් තටයුතුවල නිරතව සිටි රසිකා කුලසිංහ නර්තනාචාර්යවරියට තවදුරටත් වෙහෙස නොකොට සමුගන්නට සූදානම් වුනෙමු. සිය හිතාදර රසික ප්‍රේක්ෂකයින් වෙත කළ ඇරයුමින් ඇය හා කළ පිළිසඳර නිමාව දකින්නෙමු.

''අපි හැමදාම අළුත් දෙයක් අපේ සම්ප්‍රදායත් එක්ක ඉදිරිපත් කළා. මේ වතාවෙත් නැවුම් දෙයක් හැමෝම වෙනුවෙන් සංවිධානය කරනවා. ඉතින් අපි හැමෝටම ආදරයෙන් ආරාධනා කරනවා ඒ නැවුම් දේ විඳින්න සැප්තැම්බර් පළමුවෙනි දා සවස හයට බර්වුඩ්වල ''බීසන් සෙන්ටර්'' ශාලිවට ඇවිත් අපිත් එක්ක එකතු වෙන්න කියලා.''

සාකච්ඡා කළේ,
**සිසිර දිසානායක**

**නිවාඩුවට වෙනසක්**
Villa 16 Hikkaduwa

ලංකාවේ නිවාඩු ගත කරන්නට යන ඔබට ලෝ ප්‍රකට හික්කඩුව සුන්දර මුහුදු වෙරළ පිසගෙන එන සිසිල් මන්ද මාරුතයේ පහස විඳිමින් නිවාඩු නිකේතනයක සොදුරු බව හිමි, සියළු පහසුකම් සහිත අංග සම්පූර්ණ අපූරු නිවසක විවේකයක් විනෝදයක් සමග නිවාඩු ගත කරන්නට විමසන්න.

**සනත්: (03) 8774 2408**
0422 233 009
sanathku@yahoo.com

හික්කඩුව නගර මධ්‍යයේ
මුහුදු වෙරළට ඇවිදින දුරින්
විදුලි උපකරණ සහ ගෘහ භාණ්ඩ සමගින්
Wi Fi අන්තර් ජාල පහසුකම්
අපගේ වෙබ් අඩවිය www.villa16hikkaduwa.com

**සියලුම ජෝතිශ්‍ය කටයුතු**

දෙස් විදෙස් කේන්ද්‍ර සෑදීම, පලාපල ලියා දීම,
කරදර ගැටළු වලට පිළියම්, අපල වලට පිළියම් හා වාර්තා......
විවාහ සිහුම්, පොරොන්දම් ගැලපීම, දෝෂ විමසීම හා මඟහරවා ගැනීමට උපදෙස්.....
මංගල, මල්වර, නිවාස, විහාග, අකුරු කරවීමේ ශුභ නැකත්.......
නමට අකුරු, නම් තැබීම....
දල, සිරිපති, ක්‍රිෂ්ණමූර්ති හෝ ඕනෑම ක්‍රමයකට කර දෙන්නෙමු.
*ඊ මේල්, දුරකතන මගින් විශේෂ කඩිනම් සේවා.......*
රහස්‍යභාවය සුරකිමු
**සුබෝධා ජෝතිශ්‍ය සේවය**
www.wix.com/eppingvic/subodhabeauty
0433536097 subodhaastro@yahoo.com.au